# සාන්ත ජාකොබ් අපෝස්තුළු තුමා
## මංගලයය

## පළමුවන දේව ප්‍රකාශනය 2 කොරින්ති 4: 7–15

*ශුද්ධ වූ පාවුලු තුමන් විසින් කොරින්තිවරුන්ට ලියන ලද දෙවන හසුනෙන් උපුටා ගත් කොටසකි.*

"අපි හැම අතින් ම වටලනු ලැබුවත් කොටු වී නොසිටිමු."

එහෙත් මේ අති ශ්‍රේෂ්ඨ බලය අපගෙන් නොව දෙවියන් වහන්සේගෙන් වන බව දක්වන පිණිස, අප මේ වස්තුව රුස් කර තැබූ මැටි බඳුන් හා සමාන ය. අපි හැම අතින් ම වඩිනු ලැබුවත් කොටු වී නොසිටිමු. වියවුල් වුවත් බලාපොරොත්තු රහිත නොවෙමු. ලුහුබඳිනු ලැබුවත් අතරමං නොවෙමු: පහර ලැබුවත් නොවැනසෙමු. ජේසුස් වහන්සේගේ ජීවිතය අපේ ශරීරයෙන් ප්‍රකාශ වන පිණිස උන් වහන්සේ මරණයට භාජනය වූ ලෙස ම, අපිත් නිතර ම ශාරීරික වශයෙන් මරණයට භාජනය වෙමින් සිටිමු. අපගේ මැරෙනසුළු ශරීරයේ ජේසුස් වහන්සේගේ ජීවනය ප්‍රකාශ වන පිණිස, අපි ජීවත් ව සිටය දී නිතර ම මරණයට පාවා දෙනු ලැබ සිටිමු. මෙලෙස අප කෙරෙහි බලපාන්නේ මරණයයි. ඔබ කෙරෙහි බලපාන්නේ ජීවනයයි. තවද, "මම විශ්වාස කළ නිසා කතා කෙළෙමි"යි ශුද්ධ ලියවිල්ල කියයි. එම ඇදහිල්ල ඇති අපිත් විශ්වාස කරන නිසා කතා කරමු. සමිඳාණන් වන ජේසුස් වහන්සේ උත්ථාන කළ දෙවියන් වහන්සේ, ජේසුස් වහන්සේ සමඟ අපත් උත්ථාන කරන බව ද, ඔබ සමඟ අපත් උන් වහන්සේ ඉදිරියට පමුණුවන බව ද අපි දනිමු. මේ සියල්ල ඔබ උදෙසා සලසා ඇත්තේ දේව වරප්‍රසාදය බොහෝදෙනෙකු වෙත පැතිරී වැඩි වී යාමෙන් දෙවියන් වහන්සේගේ මහිමය සඳහා ස්තුති දීම ද අධික වන පිණිස ය.

*දේව වචනය මෙසේ ය.*

## පිළිතුරු ගීය ගීතාවලිය 126: 1–6

පිළිතුර : දුකින් වපුරන්නෝ තුටින් අස්වැන්න නෙළා ගන්නෝ ය.

ගීය : සමිඳුන් අප මුදා සියොතට ගෙනා කල,
අපට එය සිහිනයක් මෙන් විය.
එවිට අපි සිනාවෙන් ඉපිලී ගියෙමු.
ප්‍රීතියෙන් ගී ගායනා කෙළෙමු.
එවිට, "සමිඳාණෝ මොවුන් උදෙසා ඉමහත් දේ කළ සේක"යි
විජාතීහු කියන්නට ගත්හ.

සමිඳාණෝ අප උදෙසා ඉමහත් දේ කළ සේක:
එබැවින් අපි සන්තෝෂ වමු.
සමිඳුනි, අපේ සිරකරුවන්
දකුණු දිශාවේ ගලා යන ඇළ දොළ මෙන්
අපට යළි ගෙන දුන මැනව.

දුකින් කෙත වපුරන්නෝ තුටින් අස්වැන්න නෙළාගන්නෝ ය.
ඔව්හු වී මලු රැගෙන කඳුළු සළ සලා පිටත් ව ගිය නමුත්,
තම ගොයම් මිටි රැගෙන ප්‍රීතියෙන් පින පිනා ආපසු ආහ.

## සුපුවත් ජය නද යොහන් 15: 16

ආලේලූයා! ආලේලූයා!
"ඔබ මා තෝරා ගත්තේ නැත.
ඔබ ගොස් බොහෝ පල දරණ පිණිසත්,
ඔබේ පල පවතින පිණිසත් මම ඔබ තෝරාගෙන පත් කෙළෙමි"යි
සමිඳාණෝ වදාරන සේක.
ආලේලූයා!

## සුවිශේෂය

මතෙව් 20: 20–28

*සුවිශේෂක මතෙව් තුමාගේ ශුද්ධ වූ සුවිශේෂයෙන් උපුටා ගත් කොටසකි.*

"ඔබ අතරේ යමෙක් නායකයා වන්නට කැමැත්තේ නම්
ඔහු දාසයා වන්නේ ය."

සෙබදීගේ පුත්‍රයන්ගේ මව ඇගේ පුත්‍රයන් හා සමඟ ජේසුස් වහන්සේ වෙත අවුත්, දණින් වැටී, එක් වරයක් ඉල්ලුවා ය. උන් වහන්සේ කතා කරමින්, "ඔබ කුමක් ඉල්ලන්නෙහි දැ" යි ඇයගෙන් ඇසූ සේක. ඈ පිළිතුරු දෙමින්, "ඔබගේ රාජ්‍යයෙහි දී මේ මාගේ පුතුන් දෙදෙනාගෙන් එක් කෙනෙකු ඔබගේ දකුණු පසෙහි ද එක් කෙනෙකු වම් පසෙහි ද හිඳගැනීමට නියම කළ මැනවැ"යි කීවා ය. එහෙත්, ජේසුස් වහන්සේ උත්තර දෙමින්, "ඔබ ඉල්ලන්නේ කුමක් දැ යි ඔබ ම දන්නේ නැත. මා බොන්න යන දුක් වේදනා නමැති කුසලාතෙන් බොන්න ඔබට හැකිදැ" යි ඇසූ සේක. "අපට හැකි ය" යි ඔව්හු පිළිතුරු දුන්හ. උන් වහන්සේ ඔවුන්ට කතා කොට, "සැබැවින් ඔබ මාගේ කුසලාතෙන් බොන්නහු ය. එහෙත් මාගේ දකුනු පසෙහි ද වම් පසෙහි ද හිඳගන්න දීම මා සතු දෙයක් නොවේ. මාගේ පියාණන් විසින් ඒවා යම් අය සඳහා නියම කරන ලද්දේ ද ඒවා අයිති ඔවුන්ට ය" යි වදාළ සේක. දස දෙනා එපවත් ඇසූ විට ඒ සොහොයුරන් දෙදෙනා ගැන කෝප වූ හ.

එහෙත්, ජේසුස් වහන්සේ ඔවුන් තමන් වෙත කැඳවා මෙසේ වදාළ සේක: "විජාතීන්ගේ ආණ්ඩුකාරයින් ඔවුන් කෙරේ ආධිපත්‍යය පවත්වන බවත්, ඔවුන්ගේ ප්‍රධානීන් ඔවුන් කෙරෙහි බලය පවත්වන බවත් ඔබ දන්නහු ය. එහෙත්, ඔබ අතරේ එසේ නොවිය යුතු යි. ඔබ අතර යමෙක් නායකයා වන්න කැමැත්තේ නම්, ඔහු ඔබේ සේවකයා වන්නේ ය. ඔබ අතර යමෙක් ප්‍රධානියා වන්න කැමැත්තේ නම්, ඔහු ඔබේ දාසයා වන්නේ ය. මනුෂ්‍ය–පුත්‍රයාණන් වැඩියේ සේවය ලබන්නට නොව, සේවය කරන්නටත්, බොහෝ දෙනෙකුගේ මිදීම උදෙසා සිය දිවි පිදීමටත් ය."

*සමිඳාණන් වහන්සේගේ සුභාරංචිය මෙසේ ය.*